# Illegal Money Transfers continue to thrive

While the end of the war may have taken away the conditions and incentives for illegal money transfers from the UK, a new investigation by UKLanka Times has revealed that the business of illegal, unregulated money remittances to Sri Lanka is thriving and is today conducted by segments of the community that were previously not ordinarily associated with the practise.

Illegal money transfers have long been associated with criminal activity and a large part of the community has continued to utilize illegal money transfer agents, lured by exchange rates that may be two or three rupees more than the official Sri Lankan Rupee exchange rate against the British pound, but ignorant of the dangers that these transfers pose. Illegal money remittances are not regulated by any recognized financial authority such as HM Revenue and Customs or the Financial Services Authority nor are they governed by Anti-Money Laundering Regulations.

The modus operandi of the average illegal money transfer goes something like this; he or she will invite the customer to deposit money into a personal bank account and not a business bank account which in itself is a hugely risky, not to mention illegal practise. The customer is then told that those funds will be remitted to the beneficiary in Sri Lanka. In practise, the customer's funds remain in the United Kingdom and the beneficiary's bank account is credited by a pool of money that already exists in Sri Lanka; the consequence of this is of course, that a transfer does not take place through the banking system, a situation not only detrimental to Sri Lanka's already depleted banking system but prevents much needed inflow of new cash from overseas into Sri Lanka's battered economy which depends on remittances to survive.

Legal money transfer agents are required to buy what are called dealer purchases and deposit funds into a banking organization such as Commercial Bank or Hatton National Bank or Bank of Ceylon as collateral of sorts for remittance payouts. Those funds are then in turn used for investments in Sri Lanka. Those banks also pay taxes on the business they do, taxes which are used for public development projects.

Most importantly, there is what the financial industry likes to call an 'audit trail'; minimizing the conditions required for criminal and illegal activity. This lack of an audit trail means that an illegal money transfer system is fertile ground for money laundering activities; money earned through illegal activities can merely disappear into the system.

The pool of funds in Sri Lanka may have been built up through criminal activity in Sri Lanka. Unable to deposit the funds in a bank or invest it in a legal manner, a criminal might offer an illegal transfer agent in London to become a payout agent in Sri Lanka. Your unwitting friend or relative might be the beneficiary of drugs money for what all he or she knows.

Illegal money transfer agents also recruit over-stayers and visa regulation breakers on commission earning basis, allowing illegal immigrants to remain in the UK undetected and without the need to seek recourse in public funds or seek a legitimate job.

The underlying factor is that illegal money transfer services are not transparent; in an age when the opaque practises of financial institutions has brought the world to the brink of economic collapse, transparency should be of paramount importance, not only to service providers but also the average customer.

We as a community then have a responsibility to be mindful of the services that we utilize.

**Courtesy UK Lanka Times**

# ලංකාවට මුදල් යවනවා නම් ප්‍රවේසම්වන්න!

**මේ** ඉහත දැක්වෙන ඉංග්‍රීසි ලිපිය කෙසේ හෝ කියවා තේරුම් ගන්න. මෙයින් පැහැදිලි කරන්නේ මහා බ්‍රිතානයය පුරා දැන් සිදුවෙමින් පවතින නීති විරෝධී අන්දමින් මුදල් ශ්‍රීලංකාවට යවන ක්‍රමයක් ක්‍රියාත්මක වන බවය. මේ ලිපිය අප උපුටාගත්තේ **UK Lanka Times** සහරාවෙනි.


ලංකාවට ඔබ මුදල් යවන කෙනෙක් නම් ඒ මුදල් බැංකුවකින් හෝ පිළිගත් මුදල් යවන ආයතනයකින් යවන්න. ශ්‍රීලාංකිකයින් වෙසෙන එංගලන්තය ඇතුළු බොහෝ යුරෝපීය රටවල තනි පුද්ගලයින් ලංකාවට මුදල් යවන්නට පටන්ගෙන තිබේ. ඒ අය කතාකර ඉතා අඩු ගණනකට මුදල් යැවිය හැකි බව ඔබට කියනවා ඇත. මේ ගනුදෙනුව කරන්නේ මොබයිල් ටෙලිපෝනයකිනි. ඒ පුද්ගලයා කවුරුදැයි ඔබ නොදනී. එහෙත් බැංකුවට වඩා ඉතා සුළු ගණනක ලාභයට ඔබ කිසි දිනක නොදන්නා, කොහේ ඉන්නවාදැයි නොදන්නා ඒ පුද්ගලයාගේ වචන පිළිගෙන සමහර විට පවුම් දහස් ගණනක් ලංකාවට යවන්නටය කියා ඔහු කියන ගිණුමකට බැර කරනවා ඇත. සමහර විට ඒ මුදල් ලංකාවෙ ඉන්න කෙනාට නොලැබුණොත් ඔබට අහන්නට කෙනෙක් ද නැත. ඒ අන්දමින් බොහෝ දෙනෙකුගේ මුදල් දැනට ලැබී නැතුවා පමණක් නොව එය පැමිණිලි කරන්නටද ක්‍රමයක් ඔවුන්ට නැත.

මේ තත්වයට බොහෝවිට අසුව ඇත්තේ කාන්තාවන්ය. ඒ නිසා ඔබ ඉතා අමාරුවෙන් උපයන මුදල් එසේ වංචා සහගත පුද්ගලයින්ගේ දැලට අසුවී නැතිකර ගන්න එපා. මොබයිල් පෝන් අතේ ඇතිව බිස්නස් පටන්ගෙන ඇති අය දැන් යුරෝපයේ බොහෝ රටවලට පැමිණ සිටිති. මේ මුදල් යැවීම ද ඔවුන්ගේ ඒ එක් ක්‍රමයකි.

හැමවිටම බැංකුවකින් හෝ මුදල් යවන වෙනත් පිළිගත් ආයතනයක් මගින් ගනුදෙනු කරන්න. එවිට ඒ ආයතනය ඔබ යනව මුදලට සම්පූර්ණ වගකීම දරනවා ඇත. එසේ ම මෙසේ මුදල් යැවීම ද එක් අතකට නීතිවිරෝධී ක්‍රියාවකි. මේ පණිවුඩය ලංකාවට මුදල් යවන ඔබේ හිතවතුන්ට ද දන්වන්න. ඔබ ද මැනවින් අවබෝධකරගන්න. ඔවුන් ද මේ අයථා ක්‍රමයෙන් ආරක්‍ෂා කරගන්න !

# කලාකරුවන් දෙදෙනෙකුගේ අභාවය

## පතිරාජ එල් එස් දයානන්ද



**ප්‍ර**වීන රංගන ශිල්පියෙකු වේදිකා නාට්‍ය සහ චිත්‍රපට අධ්‍යක්‍ෂකවරයෙකු වූ පතිරාජ එල්. එස්. දයානන්ද මහතා (64) අභාවප්‍රාප්ත විය. යකාගෙ කම්මල නාට්‍ය නිෂ්පාදනය කරමින් වේදිකාවට පිවිසි ඔහු වේදිකා නාට්‍ය 30 ක පමණ රඟපෑවේය. හත්දින්නත්තරු, ගංගා, ජෝඩු වළලු, සෙලිනගෙ වලව්ව, තුත්තිරිමල්, සිංහ බාහු, කිවුලේ ගෙදර මොහොට්ටාල ඔහුගේ අධ්‍යක්‍ෂණයෙන් නිමවූ චිත්‍රපටවලින් කීපයකි. අහස් ගව්ව, විසිහතර පැය, ප්‍රදීපා, සිකුරු දසාව ආදී චිත්‍රපටවල ද ඔහු රඟපෑවේ ය. අවමංගල්‍ය කට යුතු ගිය සතියේ 7 වන ඉරිදා ගල්කිස්සේදී සිදුවිය.

කවුරුවත් එන්නෙ නෑ යන නමින් හැටේ දශකයේ ඔහු නිශ්පාදනය කළ වේදිකා නාට්‍යය ඉතා ජනප්‍රිය වූයේ ය.

## එච්. ඒ. පෙරේරා



**ප්‍ර**කට වේදිකා සිනමා සහ ටෙලි නාට්‍ය නළුවෙකු වූ එච්. ඒ. පෙරේරා මහතා (57) අසනීපව සිට අභාවප්‍රාප්ත විය. සෝමරත්න දිසානායකගේ වෙඩ්ඩික්කාරයෝ වේදිකා නාට්‍යයෙන් රංගනයට පිවිසි ඔහු වේදිකා නාට්‍ය 50 කට අධික සංඛ්‍යාවකට දායක විය. ටෙලි නාට්‍ය 20 ක පමණ රඟපෑවේය. දූදරුවෝ ටෙලි නාට්‍යයේ ඩයස් මහත්තයාගේ චරිතයෙන් ඔහු ඩයස් මහත්තෙයා නමින් ප්‍රේක්‍ෂකයින් අතරේ ප්‍රකට විය. දක්‍ෂ චරිතාංග නළුවෙකු ලෙස නම් කළ හැකි ඔහු හස්ති වියරුව, කූල ගෙය, දැහැන, සාගර ජලය මදි ඇඬුවා ඔබ හන්දා, පාළුම යට කෙළි මඩල ඔහු රඟපෑ චිත්‍රපට කීපයකි. සංස්කෘතික මධ්‍යස්ථාන හා ජාතික රංගන කලා පුහුණු කරුවෙකු හැටියටද එච්. ඒ. පෙරේරා කටයුතු කළේය. පසුගිය ඉරිදා ඔහුගේ අවසන් කටයුතු සිදු විය.